සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade — 11 ශ්‍රේණිය | ඉතිහාසය - I | කාලය / நேரம் / Time — පැය 1 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුයි:

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 80 ක් හිමිවේ.**
- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) සලකුණ යොදන්න.**

---

(01) පුරාණ කාලයට අයත් සාහිත්‍ය ආගමික තොරතුරු හා වංශකතා ලියවී ඇත්තේ,
(1) සෙල්ලිපි වල ය (2) තඹපත්වල ය (3) පුස්කොළපොත් වල ය (4) රන්පත් වල ය

(02) තමන් විසින් නුදුටු එහෙත් වෙන අය විසින් පවසන ලද තොරතුරු අනුව ලංකාව පිළිබඳ රචනා කළ කතුවරයෙක් වන්නේ,
(1) ඉබන් බතූතා ය (2) රොබට් නොක්ස් ය (3) රිබෙයිරෝ ය (4) ප්ලිනී ය

(03) වර්තමාන ශ්‍රී ලාංකික ආදිවාසීන් සමග සංස්කෘතිකමය හා ජීව විද්‍යාත්මක වශයෙන් සමානතා ඇති බවට පර්යේෂකයින් විසින් පෙන්වා දී ඇත්තේ කුමන යුගයේ මිනිස් ප්‍රජාව ද ?
(1) ප්‍රාග් ඓතිහාසික (2) පූර්ව ඓතිහාසික (3) මූල් ඓතිහාසික (4) ඓතිහාසික

(04) විනාශකාරී ගංවතුර පාලනය කිරීමේ තාක්ෂණය නොදත් මුල් ඓතිහාසික යුගයේ ජනතාව තම ජනාවාස පිහිටුවා ඇත්තේ,
(1) ගංගා නිම්නයේ ඉහළ කොටසේ ය (2) කඳුකර ප්‍රදේශවලය
(3) ගංගාවේ පිටාර නිම්නයට ආසන්නයේ ය (4) ගංගාවේ පිටාර නිම්නයට දුරස්ථවය

(05) අමුණක් ඉදිකිරීම සම්බන්ධව වඩාත් පැරණිතම තොරතුරක් ලැබෙන්නේ පහත සඳහන් කුමන ගංගාව සම්බන්ධවද ?
(1) මහවැලි ගඟ (2) මල්වතු ඔය (3) කිරිඳි ඔය (4) කලා ඔය

(06) පුරා විද්‍යාඥයින් විසින් පැරණි දේවාලයක නටඹුන් සොයාගත් ස්ථානය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ ,
(1) උඩරංචමඩම ප්‍රදේශයි (2) බෙල්ලන්බැඳිපැලැස්ස ප්‍රදේශයි
(3) ගල්පාය ප්‍රදේශයි (4) ඇඳිගම ප්‍රදේශයි

(07) නූතන රන්කරුවාට පවා අභියෝගයක් වූ මල් කැටයම් 21 ක් සහිත වී ඇටයක ප්‍රමාණයේ තැල්ලක කොටසක් හමු වී ඇත්තේ ,
(1) අභයගිරි කැණීම් වලිනි (2) ඉරණමඩු සැතැස්මෙනි
(3) ජේතවන කැණීම්වලිනි (4) රුවන්වැලි සෑ ප්‍රදේශයෙනි

(08) පහත සඳහන් ඓතිහාසික සිදුවීම් අනුපිළිවෙල අනුව සකස් කල විට ලැබෙන පිළිතුර තෝරන්න.
A. ශ්‍රී මහා බෝධියේ ශාඛාවන් දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම
B. සිය දහවෙනි රාජ වර්ෂයේදී දිවයිනේ ග්‍රාම සීමා සටහන් කිරීම
C. විශාල පරිමාණයේ වැව් ඉදිකිරීම
D. රුවන්වැලි සෑයේ සතර දොරටුවෙහි දන්සැල් පැවැත්වීම

(1) BCDA (2) BADC (3) BCAD (4) ABCD


iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

(09) ලංකා ඉතිහාසයේ සක්විති රජෙකු ලෙස පෙනී සිටීමට උත්සාහ කළ පාලකයා වන්නේ ,

(1) පළමු කාශ්‍යප රජු (2) දෙවන රාජසිංහ රජු (3) කුටකණ්ණ අභය රජු (4) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු

(10) අතීතයේ ජනතාව ගුංජා නමැති මිනුම් ඒකකය භාවිතාකර ඇත්තේ කුමක් මිනුම් කිරීම සඳහාද ?

(1) දිග (2) අවකාශය (3) කාලය (4) බර

(11) අතීතයේ ලංකාවේ පැවති කර්මාන්ත කිහිපයක් පහත I තීරුවේ දැක්වෙන අතර II තීරුවේ එම කර්මාන්ත පිළිබඳව තොරතුරු සඳහන් වන සෙල්ලිපි දක්වා ඇත.ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| I. රෙදි වීවීමේ කර්මාන්තය | A. මුතුගල්ල සෙල්ලිපිය |
| II. ඇත්දත් කර්මාන්තය | B. මණ්ඩගල සෙල්ලිපිය |
| III. කම්මල් කර්මාන්තය | C. වේගිරිය සෙල්ලිපිය |
| IV. රත්රන් කර්මාන්තය | D. වෙහෙරකෙම සෙල්ලිපිය |

(1) DCAB (2) ABDC (3) ABCD (4) BCDA

(12) අලංකාර ලෙසත් පරිසර හිතකාමී ලෙසත් උයන් නිර්මාණය සඳහා තාක්ෂණික ඥාණය යොදාගත් බවට දිය හැකි නිදසුනක් වන්නේ ,

(1) රන්මසු උයන (2) සීගිරි උයන (3) මහමෙවුනා උයන (4) නන්දන උයන

(13) සීගිරි ජල උද්‍යානයේ කාණු පද්ධතිය දහරාකාර ලෙස සකස් කිරීම තුළින් එහි නිර්මාණ ශිල්පියා ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ අරමුණ වන්නේ ,

(1) රොන්මඩ ස්වාභාවිකව ගුරුත්ව බලයෙන් පහළට කිඳා බැස්සවීම යි
(2) කාණු පද්ධතියේ අලංකාරය වැඩිකර ගැනීම යි
(3) කාණු පතුලේ තැන්පත් වන රොන්මඩ ඉවත් කිරීම පහසු කිරීම යි
(4) ජලමල්වල ක්‍රියාකාරීත්වය වේගවත් කිරීම යි

(14) පැරණි සමාජ සංවිධානය තුළ ' කුඩීන් ' ලෙස සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ ,

(1) ධනවත් වෙළෙන්දන් (2) ධීවරයන් (3) සාමාන්‍ය ජනයා (4) දාසයන්

(15) පැරණි බදු නීතිය යටතේ A හා B තීරු නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ ,

| A | B |
|---|---|
| 1. මතර මජිබක | A වැව් ජලය අයකරන්නන් සඳහා |
| 2. දකපති | B රජු සතු ඉඩම්වල වගා කරන්නන් සඳහා |
| 3. බොජකපති | C ඇළ මාර්ගවල මත්ස්‍යයින් ඇල්ලීම වෙනුවෙන් |

(1) CBA (2) BAC (3) BCA (4) CAB

(16) තම දියණියට සූප ශාස්ත්‍රය පුහුණු කරවීම දෙමාපියන්ගේ වගකීමක් බව සඳහන් වන මූලාශ්‍රය කුමක්ද ?

(1) සද්ධර්මාලංකාරය (2) සහස්සවත්ථුප්පකරණය
(3) දම්පියා අටුවා ගැටපදය (4) රසවාහිනිය

(17) පළමු නාගරීකරණයේ මුල් නගර දෙක වන්නේ ?

(1) අනුරාධපුරය හා යාපහුවයි (2) පොළොන්නරුව හා දඹදෙණි යි
(3) දඹදෙණිය හා යාපහුව යි (4) අනුරාධපුරය හා මාගම යි


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

- A සිට D දක්වා ප්‍රකාශ ඇසුරින් 18 සහ 19 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
  - A. - කාලිංග මාඝ පරාජය කිරීම
  - B. - ඉබන් බතුතා ලංකාවට පැමිණීම
  - C. - කව්සිළුමිණ රචනා කිරීම
  - D. - යුං ලෝ අධිරාජ්‍යයා විසින් චෙං හෝ සෙන්පතියා ලංකාවට එවීම

(18) දඹදෙණි රාජධානියට අයත් සිදුවීම් වන්නේ ,

(1) A හා C (2) B හා C (3) C හා D (4) A හා D

(19) ගම්පොල යුගයට අයත් සිදුවීම් වන්නේ ,

(1) A හා B (2) B හා C (3) C හා A (4) B හා D

(20) A හා B තීරු නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ ,

| A | B |
|---|---|
| 1. කුසුමාසන දේවිය | A. දොන් ජුවන් |
| 2. යමසිංහ බන්ඩාර | B. ටිකිරි කුමරු |
| 3. කොනප්පු බන්ඩාර | C. දෝන කැතරිනා |
| 4. පළමු රාජසිංහ | D දොන් පිලිප් |

(1) CADB (2) CDBA (3) CDAB (4) BCDA

(21) වැලිවිට සරණංකර හිමියන් සංඝරාජ පදවියකින් පිදුම් ලැබුවේ කුමන රාජ්‍ය සමයේද ?

(1) ශ්‍රී විජය රාජසිංහ රජු (2) දෙවන රාජසිංහ රජු
(3) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (4) කීර්ති ශ්‍රී රාජසිංහ රජු

(22) යුරෝපයේ මධ්‍යතන යුගයේ දී මළ භාෂාවක් බවට පත් වූ යේ පහත සඳහන් කවරක්ද ?

(1) ග්‍රීක (2) ලතින් (3) ගෝත්‍රික භාෂා (4) කතෝලික භාෂා

(23) පුනරුද සමයේ චිත්‍ර කලාව තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ

(1) ස්වාධීන නිර්මාණ බිහිකිරීමට ඉඩක් නොලැබීම යි (2) ආගමික නැඹුරුවක් දක්නට ලැබීම යි
(3) ලෞකික රසවින්දනයට මූලිකත්වය ලැබීම යි (4) ශිල්ප ශ්‍රේණි වශයෙන් ඒකරාශිව නිර්මාණ බිහිකිරීම යි

(24) ඈත අතීතයේ දී යුරෝපය හා ආසියාව අතර වෙළඳ සම්බන්ධතා පැවැත් වූ මාර්ග සියල්ල සම්බන්ධ වූ ප්‍රධාන නගරය කුමක්ද ?

(1) මිසරය (2) කොන්ස්තන්තිනෝපලය (3) ජිනෝවා (4) වැනීසිය

(25) පෘතුගීසීන් අතීතයේ දී ලංකාව හැඳින් වූ නම කුමක්ද ?

(1) සිලෝන් (2) සරන්ඩිබ් (3) හෙලදිව (4) සෙයිලන්

(26) රන්දෙනිවල සටන මෙහෙය වූ පෘතුගීසී සෙන්පතියා වන්නේ කවුරුන්ද ?

(1) අපොන්සු ලසර්දා (2) ජෙරනිමෝද අසවේදු (3) කොන්ස්තන්තිනුද සා (4) දියෝගෝ ද මේලෝ

(27) කාර්මික විප්ලව සමයේ " මැකඩම් ක්‍රමය " යොදාගන්නා ලද්දේ කුමන ක්ෂේත්‍රයටද ?

(1) සන්නිවේදන (2) ප්‍රවාහන (3) කෘෂිකාර්මික (4) දේශපාලන

(28) විසිවන සියවසේ මුල් දශක කිහිපය තුළ කාර්මික ක්ෂේත්‍රයේ අතිවිශාල ප්‍රගතියක් උදාකර ගත් ආසියාතික රට කුමක්ද ?

(1) චීනය (2) මැලේසියාව (3) සිංගප්පූරුව (4) ජපානය

(29) කොළඹ මහනුවර මහා මාර්ගය ඉදිකිරීම සඳහා මූලිකත්වය ගත් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා කවුද, ?

(1) හෙන්රි වෝඩ් ය (2) ටොරින්ටන් සාමි ය (3) එඩ්වඩ් බාන්ස් ය (4) තෝමස් මේට්ලන්ඩ් ය


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(30) ක්‍රි.ව 1795 අගෝස්තු මාසයේ දී ඉංග්‍රීසින් විසින් අල්ලාගත් ලංකාවේ ලන්දේසී බලකොටුව කුමක්ද ?

(1) ත්‍රිකුණාමලය (2) මඩකලපුව (3) මන්නාරම (4) කොළඹ

(31) පහත සිදුවීම් හා සම්බන්ධ උඩරට පාලකයා වූයේ ,

- නායක්කර් ඥාතීන්ගේ බසට අවනත වී තීරණ ගැනීම
- පත්තිරිප්පුව ඉදිකිරීම
- බෝගම්බර වැව පුළුල් කිරීම

(1) කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය (2) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය (3) ශ්‍රී විජය රාජසිංහ රජු ය (4) රාජාධි රාජසිංහ රජු ය

(32) ක්‍රි.ව 1848 දී නිදහස් සටනට හේතු වූ බදු වර්ග පැන වූ ආණ්ඩුකාරවරයා වනුයේ ,

(1) රොබට් බ්‍රවුන්රිග් ය (2) තෝමස් මෛට්ලන්ඩ් ය (3) ටොරින්ටන් සාමිය (4) විලියම් ග්‍රෙගරිය

(33) කිතු දහම ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ව්‍යාප්ත කිරීමට ක්‍රියාත්මක වූ මිෂනාරි සංවිධානය කුමක්ද ?

(1) ලන්ඩන් (2) චර්ච් (3) ඇමරිකන් (4) වෙස්ලියන්

(34) පංචමහා වාද අතුරින් ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලැබුණු වාදය කුමක්ද ?

(1) වරාගොඩ වාදය (2) ගම්පොල වාදය (3) පානදුරා වාදය (4) බද්දේගම වාදය

(35) "මද්රාසා" නම් මුස්ලිම් ආගමික පාසල් ප්‍රතිසංවිධානය ට කටයුතු කළ ආගමික නායකයා වූයේ ?

(1) ටී.බී.ජයා මහතා ය (2) සිද්දි ලෙබ්බේ මහතා ය

(3) ආරුමුග නාවලර් තුමා ය (4) පොන්නම්බලම් අරුණාචලම් මහතා ය

(36) පහත සඳහන් A,B,C,D අතරින් ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අදාල ලක්ෂණය දැක්වෙන පිළිතුර කුමක්ද ?

A. ශ්‍රී ලංකාව පළාත් 5 කට බෙදීම
B. සීමිත ඡන්ද බලය හඳුන්වාදීම
C. ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව ඇති කිරීම
D. විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම

(1) B (2) A (3) C (4) D

(37) ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා වූයේ මින් කවරෙක්ද ?

(1) පොන්නම්බලම් අරුණාචලම් මහතා (2) පොන්නම්බලම් රාමනාදන් මහතා

(3) ජේම්ස් පීරිස් මහතා (4) ඩී.බී.ජයතිලක මහතා

(38) තේ, රබර්, පොල් වගාවන්හි පර්යේෂණ ආයතන පිහිටුවා ඇති ස්ථාන පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද ?

(1) තලවකැලේ, ලුණුවිල, අගලවත්ත (2) අගලවත්ත, ලුණුවිල, තලවකැලේ

(3) තලවකැලේ, අගලවත්ත, ලුණුවිල (4) ලුනුවිල, තලවකැලේ, අගලවත්ත

(39) බ්‍රිතාන්‍ය පාලන සමයේ බිහි වූ කම්කරු පන්තිය පිළිබඳ පහත සඳහන් වගන්ති අතුරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) වැඩකරන පැය ගණන නිශ්චිත නොවීම

(2) වතු කම්කරුවන් සහ ස්වදේශීය කම්කරුවන් ලෙස කොටස් දෙකක් සිටීම

(3) කම්කරුවන්ට ඉතා ඉහල වැටුප් හිමිවීම

(4) කම්කරුවන්ට ශුබසාධන කටයුතු නොතිබීම

(40) පහත A B C D අතුරින් 1972 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ නීති සම්පාදනය කළ ආයතනය හැඳින්වූ නම කුමක්ද ?

A. ව්‍යවස්ථාදායක සභාව B. ජාතික රාජ්‍ය සභාව
C. රාජ්‍ය මන්ත්‍රණ සභාව D. පාර්ලිමේන්තුව

(1) A (2) B (3) D (4) C


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

| ශ්‍රේණිය / தரம் / Grade | 11 ශ්‍රේණිය | ඉතිහාසය - II | කාලය / நேரம் / Time | පැය 3 යි විනාඩි 10 යි |
|---|---|---|---|---|

නම / பெயர் / Name ............................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

**සැලකිය යුතුයි:**

- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

(i) යෝධ වැව, මිනිහාගල්කන්ද, මුලතිව්, ගාල්ල, මින්නේරිය වැව, කිරිඳි ඔය, ගෝකණ්ණතිත්ථ, සෙංකඩගල, කන්තරෝඩය (කදුරුගොඩ), දැදුරු ඔය, අනුරාධපුරය, කාලතිත්ථ (ලකුණු 12)

(ii) බ්‍රිතාන්‍යය, ඉතාලිය, ලිස්බන්, බෙංගාල බොක්ක, මදුරාසිය, ජාවා, (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A. බලවත් සටන් ව්‍යාපාරයක් මගින් චෝළ පාලකයින් පරදා රට නැවතත් එක් සේසත් කළ රජතුමා
B. අනුරාධපුර යුගයේ දී උණ රෝගීන් සඳහා ඉදිකරවන ලද රෝහල
C. ක්‍රි.ව 1815 උඩරට යටත් කර ගැනීම ට කටයුතු කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා
D. ශ්‍රී ලංකාව ට තේ වගාව හඳුන්වා දුන් බ්‍රිතාන්‍යය ජාතිකයා (ලකුණු 04)


- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A රූපය



(ii) 1. A රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද ?
2. එය හඳුන්වන ලද නම කුමක්ද ?
3. එය නිපදවීම සඳහා යොදාගෙන ඇති ලෝහය කුමක්ද ?
4. අතීත ආර්ථිකය පිළිබඳ මේ තුළින් හෙළිවන කරුණ කුමක්ද ? (ලකුණු 04)

B රූපය



(iii) 1. B රූපය හඳුනාගෙන නම් කරන්න.
2. මොහු හැඳින්වීම සඳහා භාවිත කරන ලද අන්වර්ථ නාමය කුමක්ද ?
3. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ මොහු දැරූ තනතුර කුමක්ද ?
4. ඔහුගේ නායකත්වය යටතේ පිහිටුවන ලද සංවර්ධන යෝජනා ක්‍රමය කුමක්ද ? (ලකුණු 04)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## II කොටස

(02) I. දීපවංශය හා මහාවංශය රචනා කිරීමේදී ආභාසය ලබාගත් කෘති තුනක් නම් කරන්න. (ලකුණු 03)

II. පහත සඳහන් සාහිත්‍යය මූලාශ්‍රවල කතුවරු නම් කරන්න. (ලකුණු04)

A. නැචුරලිස් හිස්ටෝරියා . B. මහාවංශයේ මුල් කොටස C. ඩිමුන්ඩෝ D. එදා හෙලදිව

III. ලංකා ඉතිහාසය හැදෑරීම සඳහා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙස සෙල්ලිපි කෙතරම් වැදගත් වේ දැයි කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

IV. ඉතිහාසය හැදෑරීමෙන් අපට ලබා ගත හැකි ප්‍රයෝජන තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

(03) I. ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ තෙත් කලාපීය ගල්ලෙන් වාසස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

II. පූර්ව ඓතිහාසික යුගයේ මානවයා භාවිත කළ ප්‍රධාන සුසාන ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 04)

III. පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ තාක්ෂණය කරුණු දෙකක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වභාවය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(04) I. අතීත ලංකාවේ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉදිකරන ලද පොකුණු තුනක් නම් කරන්න. (ලකුණු 03)

II. අතීතයේ මහ වැව් තැනීමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. පූර්ව ඓතිහාසික යුගයේ පැවති විද්‍යාත්මක අදහස්වල ස්වරූපය පිළිබිඹු වන අවස්ථා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV. ශ්‍රී ලංකාවේ පැවති අතීත වාරි තාක්ෂණයේ විශිෂ්ටත්වය පහත සඳහන් වැවක කොටස් යටතේ පැහැදිලි කරන්න.

A. වැව් බැම්ම B. රළපනාව C. සොරොව්ව (ලකුණු 06)

(05) I. ඓතිහාසික යුගයේ ප්‍රභූන් ලෙස හැඳින් වූ සමාජ ස්ථරයට ඇතුලත් ව සිටි වෘත්තිකයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

II. සමාජ සංවිධානයක දක්නට ලැබෙන ප්‍රධාන ධූරාවලි දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

III. මෙරට අතීත පාලකයන් පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා නීති පැන වූ ආකාරය නිදසුන් දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV. පැරණි කාලයේ ශ්‍රී ලංකාවේ සමාජය කාන්තාව ගැන ගෞරවයෙන් කල්පනා කොට උසස් අන්දමින් සලකන ලද බව කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(06) I. මහනුවර රාජධානිය හැඳින්වීම සඳහා භාවිතා කළ තවත් නම් තුනක් ලියන්න. (ලකුණු 03)

II. පහත සඳහන් සිදුවීම් හා සම්බන්ධ රජවරුන් නම් කරන්න.

A. ක්‍රි.ව 1638 ලන්දේසින් සමග ගිවිසුමක් ඇතිකර ගත් උඩරට පාලකයා
B. දෙල්ගමු විහාරයේ සඟවා තිබූ දන්ත ධාතූන් වහන්සේ මහනුවරට වැඩම කරවූ පාලකයා
C. වැලිවිට සරණංකර හිමියන් ට සංඝරාජ තනතුර පිරිනැමූ පාලකයා
D. ක්‍රි.ව 1796 ඉංග්‍රීසින් ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ අල්ලා ගන්නා විට උඩරට පාලකයා (ලකුණු 04)

III. (a) මහනුවර රාජධානියේ පරිපාලන තන්ත්‍රයේ ඉහළම පුද්ගලයා වූ රජතුමාගේ ප්‍රධාන කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

(b) රජතුමා විසින්ම විසඳූ නඩු වර්ග තුනක් දක්වන්න. (ලකුණු 05)

IV. මහනුවර රාජධානියේ ආර්ථිකය සකස් වී තිබූ ආකාරය කරුණු තුනකින් විස්තර කරන්න. (ලකුණු 06)

(07) I. බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට පාලනය සම්බන්ධ පහත කරුණු වලට පිළිතුරු සපයන්න .

A. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමුකිරීම ට බල පෑ හේතු දෙකක් ලියන්න.
B. කිචි ලිපිය අත්සන් කළ ඕලන්ද පාලකයා කවුද ? (ලකුණු 03)

II. A සිට D දක්වා ප්‍රශ්න වලට අදාල නිවැරදි පිළිතුර ලියා දක්වන්න.

A. 1818 නිදහස් සටනට ආසන්නතම හේතුව
B. දෙවන නිදහස් සටනේ ප්‍රධාන සටන් මධ්‍යස්ථානය
C. ඉස්ලාම් ආගමික පුනර්ජීවනය සඳහා නායකත්වය දුන් පුද්ගලයා
D. මෙරට ජාතික පුනරුද සමයේ ආරම්භ කළ ප්‍රථම මුද්‍රණාලය (ලකුණු 04)

III. හින්දු පුනර්ජීවන ව්‍යාපාරයේ දී ආරුමුග නාවලර්තුමාගේ ක්‍රියා කලාපය කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

IV. බෞද්ධ ආගමික පුනර්ජීවනය සඳහා මෙරට ගිහි පැවිදි උගතුන් ක්‍රියාකළ ආකාරය කරුණු තුනක් යටතේ විස්තර කරන්න. (ලකුණු 06)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## III කොටස

(08)

I. චින්තනයේ ප්‍රබෝධයත් සමග පුනරුද සමයේ දී පල්ලියේ ආධිපත්‍ය විවේචනය කළ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

II. පුනරුද සමයේ දී පහත නිර්මාණ හා සොයාගැනීම් කළ පුද්ගලයින් නම් කරන්න.

A. මොනාලිසා චිත්‍රය

B. දුරදක්නය

C. ග්‍රහලෝක සූර්යයා වටේ ඉලිප්සාකාරව ගමන් ගන්නා බව

D. ලෙඩ රෝග සෑදීම ට තුඩුදෙන හේතු සහ ඒවාට ප්‍රතිකර්ම සොයාගැනීම (ලකුණු04 )

III. පුනරුද සමයේ දී භාෂාවේ හා සාහිත්‍යයේ ඇති වූ පුනර්ජීවනය කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

IV. පුනරුද සමයේ දී යුරෝපයේ දේශපාලන හා ආර්ථික අංශවල ඇති වූ වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09)

I. බ්‍රිතාන්‍ය හැර කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ යුරෝපා රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)


II. පහත සඳහන් සොයා ගැනීම් සිදුකළ පුද්ගලයින් නම් කරන්න.

A. ගුවන් යානය B ආරක්ෂක ලාම්පුව C දුම්රිය එන්ජිම D රූපවාහිනිය (ලකුණු04)

III. කාර්මික විප්ලවය ලෝක ආර්ථිකය තුළ ඇතිකළ වෙනස්කම් කරුණු දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 05)

IV. කාර්මික විප්ලවය ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික හා ප්‍රවාහන යන ක්ෂේත්‍ර කෙරෙහි සිදු කරන ලද බලපෑම විස්තර කරන්න. (ලකුණු 06)


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources
iexamhub





iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers  Model Answers - Study Resources




iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources